# තිරයෙන් පිටුපස කොටි ගිණි කෙළි

## ආරක්ෂාව

කලකට පෙර සමහරු කොටි සංවිධානය හැඳින්වූයේ කිසිදු ගැටළු, ප්‍රශ්න නැති මහමෙරක් සේ නොසැලෙන සංවිධානයක් ලෙසය. එහෙත් මීට අවුරුද්දකට පමණ පෙරදී එම පිරිස් තුෂ්ණිම්භූත කරමින් කොටි සංවිධානය දෙකඩ විය. ප්‍රභා කරුණා වශයෙන් පාර්ශව දෙකකට බෙදිණ.

මේ කොටි සංවිධානය බරපතල ලෙස ලෝකයට පෙනෙන්නට දෙකඩ වූ ප්‍රථම වතාව බව සැබෑය. එහෙත් කොටි සංවිධානය තුළ බෙදීම්, හැලහැප්පීම් තිබුණේ අද ඊයේ පටන් නොවේ. 1970 දශකයේ එය බිහිවූ වකවානුවේ පටන්ම ඒ තුළ විවිධ හැලහැප්පීම් තිබිණ. එහෙත් ඒවා කරළියට ආවේ කලාතුරකිනි. සියල්ල යටපත්කොට ප්‍රභාකරන් නැගී සිටියේය. මේ නිසා ඇතැමුන්ට කොටි සංවිධානය මහමෙරක් සේ පෙණින.

පසු කලෙක කොටි සංවිධානය විසින්ම ඝාතනය කෙරුණු උමා මහේෂ්වරන් මුල් කාලයේ ප්‍රභාකරන් සමඟ එක්ව කටයුතු කළ අයෙකි. ඔහු ප්‍රභාගෙන් ඈත් වූයේ අභ්‍යන්තර ගැටුමක ප්‍රතිඵලයක් වශයෙනි. පසුකලෙක කොටි සංවිධානයේ නියෝජ්‍ය නායකයා වූ මහත්තයා ද ප්‍රභාකරන්ගේ අණින්

ප්‍රභාකරන් ජීවත් වනවාද නැද්ද යන්න අදට ද සැක උපදවන කාරණයකි. මේ අතරවාරයේ කොටි සංවිධානයේ අභ්‍යන්තර ආරවුල් අන් කවරදාකටත් වඩා වැඩියෙන් දැකගත හැකිය. සමහරු මෙය හඳුන්වන්නේ ප්‍රභාකරන්ගේ මිය යාමත් සමඟ සංවිධානයේ දෙවන පෙළ නායකයන් නායකත්වයට මිනී මරා ගන්නා බවකි. එය එකහෙළා පිළිගැනීමට අපට නොහැකිය. කෙසේ වෙතත් ප්‍රභාකරන් ජීවතුන් අතර සිටිය ද නොසිටිය ද මේ වන විට කොටි සංවිධානයේ නායකත්ව ප්‍රශ්න නම් නිමක් නැත.

වසර ගණනාවක් තිස්සේ ප්‍රභාකරන්ගේ විශ්වාසවන්තම සගයෙකු වූත් කොටි සංවිධානයේ න්‍යායාචාර්යවරයා වූත් ඇන්ටන්



ස්වර්ණම් මේ වන විට ත්‍රිකුණාමලයේ කොටි නායකයා ලෙස ක්‍රියා කරයි. අලුත්ම ආරංචිමාර්ගවලට අනුව ඔහු ද ඉහළ පෙළේ කොටි නායකයන් සමඟ ආරවුලක් හදාගෙන තිබේ.

මහානායකයෙක් සේ පෙනී සිටියේය. එහෙත් ඒ සති කීපයකට පමණි. හදිසියේම ඔහු යළි අතුරුදහන් විය. තවමත් ඔහු කටයුතු කරන්නේ අප්‍රකටවය. මේ සිදුවීම් ද කොටි නායකත්වයේ ආරවුලක ප්‍රතිඵලයක් බව බොහෝ දෙනා කියති.

ස්වර්ණම් මේ වන විට ත්‍රිකුණාමලයේ කොටි නායකයා ලෙස ක්‍රියා කරයි. අලුත්ම ආරංචිමාර්ගවලට අනුව ඔහුද ඉහළ පෙළේ කොටි නායකයන් සමඟ ආරවුලක් හදාගෙන තිබේ. ඔහු තමන්ට හිතවත් කොටි සාමාජිකයන් සමඟ ත්‍රිකුණාමලය සාම්පූර් ආශ්‍රිතව වෙනමම රැඳී සිටින බවක් ද කියවේ.

කොටි නායකත්වයේ අවුල් වඩාත් කැපී පෙනෙන්නේ නැගෙනහිර පළාත තුළය. නැගෙනහිර වත්මන් කොටි නායකයා වන්නේ බානුය. බානු

ඝාතනයට ලක්විය. එයද අභ්‍යන්තර ගැටුමක ප්‍රතිඵලයකි. මීට අමතරව කොටි සංවිධානයේ අභ්‍යන්තර ගැටුම් වෙනුවෙන් ඝාතනයට ලක්වූ දෙවන පෙළ කොටි නායකයෝ රැසකි. කුමක්දෝ හේතුවකට මේ සෑම ආරවුලකදීම ජය ගන්නට ප්‍රභාකරන්ට හැකි විය. කෙසේ වෙතත් ඔහු එම ආරවුල් ජය ගත්තේ අතිශය කෲර ආකාරයටය.

මේ ගිය ගමන ප්‍රභාකරන්ට වැරදුණේ කරුණා සමඟ ආරවුලක් හදාගත් අවස්ථාවේදීය. ඇත්තටම මේ අවස්ථාවේ දී කරුණා ප්‍රභාකරන්ට වඩා කපටි විය. ප්‍රභාකරන් කරුණාව සිරගත කොට මරා දැමීමට උත්සහ ගනිද්දී ඔහු සංවිධානයත් දෙකට කඩාගෙන ආරක්ෂාව සපයා ගත්තේය. අනතුරුව තවමත් අවුරුද්දකටත් වඩා වැඩි කාලයක් මුළුල්ලේ ඔවුහු ඇවිලෙමින් සිටිති.

සුනාමිය ලංකාවට කඩාපාත් වූයේ මේ අතරතුරදීය. සුනාමියෙන් ප්‍රභාකරන් මියගිය බව කරුණා පාර්ශවය කියයි. කොටි එය ප්‍රතික්ෂේප කළ ද ප්‍රභාකරන් වැනි පුද්ගලයෙකු ප්‍රසිද්ධියේ පෙනී සිටිය ද

බාලසිංහම් අද කොටි විසින්ම ලන්ඩනයේ හුදකලා කොට ඇත්තේය. බාලසිංහම්ගේ තැන ගෙන ඇත්තේ තමිල් සෙල්වන්ය. විදේශ රටවල සංචාරයට යන්නේත් ලෝක නායකයන් සමඟ සාකච්ඡා කරන්නේත් ලංකාවේ හැම වැඩකදීම ඉදිරියට එන්නේත් තමිල් සෙල්වන්ය. එදා බාලසිංහම් කළ සමහර දෑ අද තමිල් සෙල්වන් කරන බව හොඳ හැටි පැහැදිළිය. බාලසිංහම්ට වෙනස්කම් කොට ඇත්තේ මේ ආකාරයට පමණක් නොවේ. බාලසිංහම්ට ලන්ඩනයේ දී උදව් උපකාර කළ ද්‍රවිඩ ජාතිකයන් කීප දෙනෙක්ම ලංකාවට පැමිණ සිටිය දී අත්අඩංගුවට ගෙන වදහිංසා පැමිණවීමට කොටි නායකයන් ක්‍රියාකර තිබිණ. මේ හෙළිවන්නේ බාලසිංහම් විරෝධය නොවේද? බාලසිංහම් හා සංවිධානය අතර ගැටුමක් ඇති බව නොවේද?

මුහුදු කොටි නායක සුසෙයි කොටි නායකත්වය සමඟ ආරවුලක් හදාගෙන ඇති බව ප්‍රකට කාරණයකි. සුනාමියට පෙර පසෙකට විසිවී සිටි සුසෙයි, ඉන් පසු

වන්නියේ උපන් අයෙකි. වන්නියේ උපන් බානු යටතේ කටයුතු කිරීමට නැගෙනහිර උපන් කොටි සාමාජිකයන් හෝ කොටි නායකයන් බහුතරයක් කැමති නැත. මෙය දිනෙන් දින මෝරා යමින් ඇති බරපතල ප්‍රශ්නයකි. අම්පාර දිස්ත්‍රික් කොටි නායකයා වන ජනර්තන් බානු සමඟ බරපතල ආරවුලකට මැදිවී සිටින බව පැවසේ. ඔහුද ස්වර්ණම් මෙන් වෙනමම කොටි සාමාජිකයන් පිරිසක් සමඟ කටයුතු කරන බවක් ද දැනගන්නට ඇත.

මේ සියලු කරුණු කාරණාවලින් පෙනී යන දෙයක් වන්නේ මේ වන විට කොටි සංවිධානය අභ්‍යන්තර ආරවුල්වලින් පිරුණු තත්වයකට පත්ව ඇති බවයි. එහෙත් මේ අභ්‍යන්තර ආරවුල් වසාගෙන මතුපිටට තම හයිය පෙන්නාගෙන සිටීමට ඔවුහු තවමත් සමත්ව සිටිති. ඇත්තටම කියනවා නම් කොටි සංවිධානයේ මේ මතුපිට ආවරණය ඉවත් කළහොත් දැන් එය තුළ ඇත්තේ කුඩු පට්ටම් වී ගිය අන්තර්ගතයකි.

ඒ අනුව බලන කල මේ මතුපිට ආවරණය ඉවත් කිරීම හරහා ශ්‍රී ලංකාවේ අනාගතය යහපත් කිරීමට මඟ පාදා ගත හැකිය. එහෙත් මොකද්දෝ අවාසනාවකට අපේ නායකයන්ට එහෙව් උවමනාවක් නැත. ඔවුන්ට අවශ්‍යව ඇත්තේ කොටින්ගේ මතුපිට දෙස බලා තීරණ ගනිමින් ඔවුන්ට ඕනෑ විදිහට කටයුතු කිරීමය. මෙය මුළුමහත් ශ්‍රී ලංකාවේමත්, ශ්‍රී ලාංකිකයන්ගේමත් අවාසනාවකි.

**පෙරමුණේ රාළ**

20 පිටෙන් ඉතිරිය

කවිරත්නගේ පුත් වත්මන් පළාත් සභා මන්ත්‍රීවරයෙකු වන සංජීව කවිරත්න වෙනුවට රත්තොට ආසනයට පත්කොට ඇත්තේ ස්වාධීන රූපවාහිනී සේවයේ හිටපු සභාපති ගයිරුක පේරුසිංහය. මේ හැර හිටපු ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයෙකු වන ආරිය රූබසිංහ හක්මනටත්, ෆීනික්ස් වෙළඳ ප්‍රචාරණ සමාගමේ හිමිකරුවා වන අර්වින් වීරක්කොඩි මහරගමටත් පත් කොට ඇත

රනිල් වික්‍රමසිංහගේ මෙම පත් කිරීම් නිසා පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් සෑම දෙනාම කලකිරීමට පත්ව සිටිති. රනිල් වික්‍රමසිංහ මේ අන්දමට 'තරුණ' සංවිධායකයන් පත් කරගෙන ඇත්තේ තම පක්ෂ නායකත්වය රැක ගැනීම සඳහා බව පක්ෂයේ ඇතැම් ජ්‍යෙෂ්ඨයෝ පෙන්වා දෙති. ඉදිරි ජනාධිපතිවරණයෙන් ද තමන් පරාජය වූ පසු තමන්ට එරෙහිව පක්ෂය තුළ කැරැල්ලක් ගොඩ නැගීම වැලැක්වීම සඳහා මෙලෙස තමන්ට හිතවත් පිරිසක් පත් කරගෙන ඇති බවයි ඔවුන් පෙන්වා දෙන්නේ. මෙම නව ආසන සංවිධායකවරුන් අතරින් බහුතරය මාධ්‍යවේදීන්ය. ඒ සියලු දෙනාම පෞද්ගලික අංශයේ මාධ්‍යවල සේවය කරන හා සේවය කළ අය වෙති. මේ නිසා මෙම මාධ්‍ය පිළිබඳ හා ඒවායේ සේවය කරන මාධ්‍යකරුවන් පිළිබඳව කිසියම් අදහසක් ලබා ගැනීම පහසුය. රනිල් මේ අන්දමට මාධ්‍යකරුවන් රැසකට ආසන සංවිධායකකම් දී ඇත්තේ පෞද්ගලික මාධ්‍යවල සිටින අනෙකුත් මාධ්‍යකරුවන්ව ද එවැනි ආසාවක් ඇති කොට තමන්ගේ පිට කසා ගැනීමට යොදවා ගැනීම සඳහා බවට ද එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨයෝ පෙන්වා දෙති. ■